Australian Government

Department of Health

**මෙල්බර්න්හි කෝවිඩ්-19 ආසාදන වැඩිවීම මගින් ඕස්ට්‍රේලියාව උගත යුතු පාඩම්**

මෑතකදී මෙල්බර්න්හි සමහර ප්‍රදේශවල කෝවිඩ්-19 ආසාදන වැඩිවීම කලකිරීමට හේතුවක් වුවද, අපි සැමවිටම වැඩිපුර ආසාදන අපේක්ෂා කලෙමු. මෙය මුළු රටටම ලබාදෙන ඉතා වැදගත් මතක් කර දීමකි.

මෙම ආසාදන වැඩිවීම මගින් අප පාඩම් උගත යුතු අතර, එසේ නැතිනම් අප සැම දෙනා විසින් කෝවිඩ්-19 ආසාදනයට එරෙහිව කල කටයුතුවල බොහෝ දේ උවදුරෙහි හෙළන අතර ඕස්ට්‍රේලියාව පුරා ආසාදන බොහෝමයක් දැකීමේ අවදානමට මුහුණ දෙනු ඇත.

මා විසින් සව්ගැන්වීමට බලාපොරොත්තුවන වැදගත් පණිවුඩයක් වන්නේ, අප විසින් කෝවිඩ්-19 ආසාදනයට එරෙහිව කල සටන සාර්ථක වුවද, ඕස්ට්‍රේලියාවේ වසංගතය ඇතිවීමට පෙර අප ජීවත්වූ ආකාරයට නැවත යාමට හැකි තත්වයක අප තවම නැති බවයි. වයිරසය අප සමග තවම තිබෙන අතර, එය තව සෑහෙන කාලයක් තිබෙනු ඇත. ජාත්‍යන්තර තත්වය දිගින් දිගටම අයහපත් අතට හැරෙමින් පවතින අතර එය යහපත් අතට හැරීමක් නොපෙනේ.

වික්ටෝරියා ප්‍රාන්තයේ ආසාදන වැඩිවීම මගින් පෙන්වන්නේ අප විසින් භෞතික දුරස්ථභාවය සහ යහපත් සනීපාරක්ෂක ක්‍රියා මාර්ග අනුගමනය නොකරන්නේ නම් සහ අසනීප අවස්ථාවල නිවසේ රැඳී නොසිටීනම්, වසංගතය කොතරම් පහසුවෙන් පැතිර යා හැකිද යන්නයි. කෝවිඩ්සේෆ් ඇප් එක ඔබගේ ජංගම දුරකථනය වෙත ලබා ගැනීම කොතරම් වැදගත්ද යන්න මේ මගින් මතක් කර දෙන අතර ඒ මගින් කෝවිඩ්-19 ආසාදනයවුණු බවට සනාථවූ අය හා සමීපව සම්බන්ධවුණු අයව විගස සොයා ගැනීමට බලධාරීන් හට හැකියාව ලැබේ.

රෝගය විමර්ශනය කරන අය විසින් මෙම සමීප සම්බන්ධතා සොයා ගැනීම වේගවත් වන තරමට, වයිරසය ව්‍යාප්තවීම වඩා වේගයෙන් වැළැක්විය හැකිය.

එසේනම්, අප විසින් මෙල්බර්න්හි ආසාදන වැඩිවීම මගින් කුමක් ඉගෙන තිබේද? නව ආසාදනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සම්බන්ධ වන්නේ පවුල් කණ්ඩායම් එක්වීම සමගය.

මේ මගින් අපට කුමක් කියාපායිද? සිය පවුලේ උදවිය ඇතුළු ඔවුන් හොඳින් හඳුනන ඕස්ට්‍රේලියාවේ වෙසෙන සමහරුන් කෝවිඩ්-19 හි ඇති භයානකබව අවබෝධකර නොගෙන ඇති බවයි.

කෝවිඩ්-19 සීමා ලිහිල් කර ඇති බැවින් නිවෙස් සහ හෝටල් සහ භෝජනාගාර වැනි ස්ථානවල වැඩි දෙනෙකු හට හමුවිය හැකිය. ඕස්ට්‍රේලියාවේ වෙසෙන සමහරුන් ආරක්ෂාකාරී ලෙස භෞතික දුරස්ථභාවය තබා ගැනීමට කටයුතු නොකරයි. මේ මගින් කෝවිඩ්-19 වෙත පහසුවෙන් ගොදුරුවිය හැකි වයසින් වඩා වැඩි පවුලේ සාමාජිකයන් මෙන්ම පුළුල් ප්‍රජාවද අවදානමට ලක් කරනු ඇත.

එමනිසා, ඔබ මිතුරෙකු හමුව ආහාරපාන ගැනීමට යම් ස්ථානයකට හෝ කිසිවෙකුගේ නිවසකට යන්නේ නම්, කරුණාකර නිසි භෞතික දුරස්ථභාවය පවත්වා ගනිමින් එය කරන බවට වග බලා ගන්න.

මෙම වැදගත් පණිවුඩය ඔබගේ පවුලේ උදවිය, මිතුරන්, අසල්වාසීන්, සහ ඔබගේ ප්‍රජාව තුල සහ ව්‍යාපාරවල සිටින අය අතරේ බෙදාහදා ගන්නා ලෙසට මම ඔබව උනන්දු කරමි.

වික්ටෝරියා ප්‍රාන්තයේ ආසාදනය වැඩිවීම මගින් අපට තවදුරටත් පවසන්නේ භෞතික දුරස්ථභාවය සහ යහපත් සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කිරීම සහ කෝවිඩ්සේෆ් ඇප් එක ඔබගේ ජංගම දුරකථනය වෙත ලබා ගැනීම යන වැදගත් පණිවුඩය, තමා කථා කරන හෝ කියවන ප්‍රථම භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවන ප්‍රජාවන් අතරට යැවීමට කටයුතු කලයුතු බවයි.

Australian Government
Department of Health

කෝවිඩ්-19 වසංගතය පැතිරෙන අතරතුර බහුසංස්කෘතික ප්‍රජාව යාවත්කාලීන කර තබන බවට වගබලා ගැනීම සඳහා සැහෙන ප්‍රයත්නයක් දරා ඇත.

උදාහරණ වශයෙන්, පුද්ගලයන්, නිවැසියන් සහ ව්‍යාපාර හට උපකාරවන වැදගත් තොරතුරු භාෂා 63 කට පරිවර්තනය කර ඇත.

*කෝවිඩ්-19 සම්බන්ධ තොරතුරු ඔබගේ භාෂාවෙන්* යන වෙබ් අඩවිය දියත් කිරීමෙන් පසු 900,000 කට වඩා එම පිටු බැලූ අය සිටී.

ස්වදේශ කටයුතු පිළිබඳ කොමන්වෙල්ත් දෙපාර්තමේන්තුව, සිය ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරීන් මගින්, වසංගතය ඇරඹීමෙන් පසු 4,300 වතාවක් බහුසංස්කෘතික ප්‍රජා කණ්ඩායම් සමග සම්බන්ධවී ඇත.

මෙයට පරිබාහිරව, සමහර අය කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගැනීමට පැකිලීම අවශ්‍ය නොවුනද ඒ සම්බන්ධයෙන් කණස්සල්ලක් දක්වන බව ඉතා පැහැදිලිය. මේ සම්බන්ධ කරුණු කිහිපයක් සම්බන්ධයෙන් ඔබට තහවුරුවක් ලබා දිය යුතුව ඇතඃ ඕස්ට්‍රේලියානු රජය මගින් අරමුදල් සපයන වෛද්‍යවරුන් විසින් මෙහෙයවනු ලබන ශ්වසන සායනවල, ආසාදනය සම්බන්ධයෙන් පරීක්ෂා කර ගැනීම සම්පූර්ණයෙන් නොමිළේ වන අතර  ඔබ හට මෙඩිකෙයාර් කාඩ්පතක් තිබීම අවශ්‍ය නැත.

කෝවිඩ්-19 පිටුදැකීමට දිගු ගමනක් ඇති අතර, තවම සැහීමට පත්වීමට කාලය උදාවී නොමැත. කරුණාකර භෞතික දුරස්ථභාවය සහ යහපත් සනීපාරක්ෂක ක්‍රියා මාර්ග අනුගමනය කරන්න. එස්ම, ඔබට අසනීපනම්, කරුණාකර නිවසේ රැඳී සිටින්න.

**ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රධාන හෙද සහ වින්නඹු නිලධාරී, ඇලිසන් මැක්මිලන්**